# මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
# நிதி, திட்டமிடல் அமைச்சு
# MINISTRY OF FINANCE AND PLANNING


මහ ලේකම් කාර්යාලය, කොළඹ 01. செயலகம், கொழும்பு 01. The Secretariat, Colombo 01.

කාර්යාලය / அலுவலகம் / Office: 2484500, 2484600, 2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-011-2449823
වෙබ් අඩවිය / வெப்தளம் / Website: www.treasury. gov.lk


මගේ අංකය / எனது இல. / My No.: **SA/DD/FA/1/3**
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2006 දෙසැම්බර් ?? දින

රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක :188(1)/2006

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත,

<u>2006 මුදල් වර්ෂය සඳහා වූ ගිණුම් පියවීම</u>

උක්ත මැයෙන් නිකුත් කරන ලද 2006 නොවැම්බර් 01 දිනැති ගිණුම් චක්‍රලේඛ අංක: 188/2006 හි ඇතුලත් උපදෙස් කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

02. 2007 අයවැය කථාවේදී සඳහන් කළ පරිදි 2006 වසර තුල ක්‍රියාත්මක කිරීමේදී අඩු ප්‍රගතියක් දැක් වූ සංවර්ධන ව්‍යාපෘතීන් ප්‍රමුඛතා පදනමක් යටතේ 2007 වසරේදී ක්‍රියාත්මක කළ යුතුව ඇති බැවින් ප්‍රස්තුත චක්‍රලේඛයේ 5 ඡේදයට පහත සංශෝධනයන් ඇතුලත් විය යුතු බව මෙයින් දැනුම් දෙමි.

" මු.රෙ. 215 (3) (ආ) හා (ඇ) හි නිශ්චිතව සඳහන් කර ඇති වියදම් ගනයට අයත් නොවූවද, දැනට ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘතීන්ට අදාලව 2006 වර්ෂය සඳහා සලසනු ලදුව එහෙත් ඉතිරි වී ඇති ප්‍රාග්ධන ප්‍රතිපාදන අහෝසි වුවහොත් 2007 වර්ෂයේ අපේක්ෂිත ඉලක්කය ලඟා කර ගැනීමට අපහසු වන බවට ඔබ විසින් සෑහීමට පත් වන අවස්ථාවලදී එබඳු ඉතිරි ප්‍රාග්ධන ප්‍රතිපාදන මුළුමනින්ම තැන්පත් ගිණුමට මාරු කිරීමට අවසර දෙනු ලැබේ.

සංවර්ධන ව්‍යාපෘතීන් සම්බන්ධයෙන් 2006 වර්ෂයේ සලසා ඇති ප්‍රතිපාදන, 2006.12.31 දිනට තත්‍ය වියදම්, වර්ෂ අවසානයේ නිරවුල් කිරීමට ඉතිරි වී ඇති වගකීම්, 2007 සඳහා වූ ඉලක්කය ලඟා කර ගැනීමට අවශ්‍ය අරමුදල් ප්‍රමාණය සහ 2007 අයවැය ඇස්තමේන්තුවල සලසා ඇති ප්‍රතිපාදන ප්‍රමාණය ආදී තොරතුරු ඉල්ලුම් පත්‍රයේ ඇතුලත් කළ යුතු වේ."

පී.බී. ජයසුන්දර
භාණ්ඩාගාර ලේකම්

පිටපත :- විගණකාධිපති

Circulars /L/HP